

# මිහි මත සුන්දරතම වන දිවිය

**මඩ වුන පාරේ දිගේ ජීප් රථය ගමන් කළේ ලිස්සන මාළුවෙක් වගේය කීවද එහි වරදක් නැත. දක්ෂ නැවියෙකු ගල්පර මග හැර යාත්‍රා කරන්නා සේ මගේ මාර්ගෝපදේශක යුරී අල්බකියුරිකියු වාහන රෝද වලට මඩ වුන වගුරු වලවල් මග හරිමින් වාහනය ඉතාම අපූරු ලෙස හැසිරුවේය. ඔහු වාහනයේ වේගය බාල කළේ කොටයක් දෙකට පලා දමා තැනූ දැව පාලමෙන් එගොඩ වීම සඳහා පමණි.**

"මේ වගේ පාලමකින් වාහනය එතෙර කරන විට වැඩිපුර සිතන්න උවමනා නෑ. තමන්ගේ අනාරක්ෂිත බව ගැන "යූරි" ගේ හිත තුළ ආරක්ෂාව ගොඩ නැගී තිබුනේ ඒ අත්දැමටයි. ඔහු ගියරය වෙනස් කළේ ය. දිය පහරේ කැලති සිටි 'පිරන්හා' මත්ස්‍යයන් උඩ පනින්නට විය.

පරිසරය පුරාම ඇත්තේ දුඹුරුව කහ ගැහී ගිය පරිසරයකි. ඉඳහිට හමුවුන 'පාම්' සහ 'අම්බුවා' ගසක පමණක් කොළ පැහැය තැවරී තිබුනි. එකවිටම ඔවුන් තිගැස්සී ගියේ ජල තලාවල වැසිරී සිටින කිඹුලන් සිය ගණනක් දුටු විටය.

මීටර් දෙකක් පමණ දිග ඇති සර්පයන් ගොන්නකි. ජලයෙන් ඉහළට පෙනුනේ-ඔවුන්ගේ නෙරා ගිය ඇස් පමණි.තවත් කිලෝමීටර් කිපයක් ගෙවී ගිය විට හදිසියේම වාහනයේ තිරිංග තද විය. යූරි මීටර් 20 ක් පමණ ආපස්සට රථය ගෙන පෙන්වන ලද ගසේ කඳ සීරී තිබුණි. දැන් ටිකකට කලින් ජගුවරයෙක් මේ ගස් කඳේ නියපොතු උල් කරලා මම දෙනෙ හොඳින් පළල් කොට ගස දෙස බැලුවෙමි.

තවත් ටික දුරක් යන විට අපි දුටුවේ guina pigනමින් හඳුන්වන සත්ව කොටසකි. දිය කඩිත්තක් වෙතට ඇදෙන මෙම සතෙකුගේ බර කිලෝ 50 ක් තරම්ය. ලෝකයේ විශාලතම ලැටිගාන කුලයට (Rodent) අයත් මෙම Capybaras අපිට අපූරු දර්ශනයක් විය.

පාරේ අනෙක් පස සිටියේ මීටර් 5 ක් පමණ දිගැති කහ පැහැති ඇනකොන්ඩාවෙකි. වගුරු බිමේ ලැග සිටි ඇනකොන්ඩා මග හැර මීටරයක් පමණ ඉදිරියට ගිය විට ජැබිරෝවෙක් දැක ගන්නට ලැබින.

මීටරයක් පමණ උස ඇති ජැබිරෝ සිය දිග කෝටු වැනි කකුල් ඇන ඇන ගොස් ගෙම්බෙකු අල්ලා ගිල දැම්මේය.

සැම දිනකදී මා දුටුවේ පැන්ටනාල් වගුරු බිමේ ආශ්වර්යයි. වර්ග කිලෝ මීටර් 300000 ක් පමණ විශාල වූ මෙම වගුරු බිම් ප්‍රදේශයට 'බ්‍රසීලය' බොලිවියාව පැරගුවේ යන රටවල් තුනේම කොටස් අයිති වෙනවා. ස්වභාවධර්මයේ හාස්කමට සාක්ෂි සපයන මෙම වනාන්තරයේ කුරුළු විශේෂ 650 ක් ද මත්ස්‍ය විශේෂ 300 ක්ද ක්ෂිරපායි සත්ව විශේෂ 102 ක්ද උරග විශේෂ 177 ක්ද ජීවත් වෙනවා.

ගොන් බැඳි කරත්ත, ගව පට්ටි දක්කන ගොපල්ලන්ගේ ජීවමාන දර්ශන තුළින් තවමත් ඉතිහාසයේ නෂ්ටාවශේෂ මෙහි ඉතිරිව ඇත.මෙහිදී මිනිසුන්ගේ කාලය ගත වෙන්නේ පැය ගණනට නොව දින ගණනටය. රතු පිත්ත පටියක් ලෙස දිස්වෙන මහා මාර්ගයකි. පැන්ටනාල් වගුරු බිම හරහා පෝංකෝන් සිට පොටෝ ජෙප්රි දක්වා ලී පාලම් 127 ක් පසු කරමින් දිවෙන මෙම මහාමාර්ගය කිලෝමීටර් 150 ක් දිගය. වැසි කාලයේ දි පාර වගුරක් නොවී තබා ගැනීමට ඉංජිනේරුවන් විසින් පොළව මට්ටමේ සිට අඩි හතරක් ඉහළට ඔසවා මාර්ගය ඉදි කරන ලදී. පාර දෙපසින් පස් ලබා ගෙන ඇති වුන වලවල් වතුරින් පිරි මාළුන්ගෙන් ගහණය වතුරේ රැඳීම නිසා අනෙකුත්සත්ව විශේෂයක්ද මෙහි පැමිණ වාසභූමි ඉදිකර ගත්හ. විශිෂ්ට වූ වන ජීවි උරුමය ප්‍රදර්ශනය කරන මහාමාර්ගයක් වෙනොත් මේ 'පැන්ටනාල්' ප්‍රදේශය යන සෘජු පිළිතුර එතැනට ආදේශ කළ හැකිය.

නමුත් මේ උරුමය අවුරුද්දේ මාස කීපයකට පවතී. ඔක්තෝබර් සිට අප්‍රේල් දක්වා ඇද හැලෙන නිරන්තර වර්ෂාවට ප්‍රදේශයෙන් 80% ක් පමණ වතුරෙන් යට වී යයි. ඉතිරි වුන 20% ක් වූ උස් බිම් මත සතුන් රැදි සිටිති. ජලය රැඳුන ස්ථානවල සිටින මසුන් ජලය බැස ගිය තැන සිට අනෙකුත් සතුන්ගේ ගොදුරු බවට පත් වේ. ජලය රැඳී රොන් මඩ තැන්පත් වුන පොළවේ නව දළු සරුලා වැඩෙති. පැන්ටනාල් වගුරු බිම විශාල ස්පොන්ච්යක් වැනිය. කිලෝ මීටර් 1685 ක් දිග පැරගුවේ ගංගාවෙන් පිටාර යන ජලය උරා ගෙන ඒවා යළින් මුහුදට මුදා හරී. ජලයේ මුදාහැරීම ඉතාම සීරුවට සිදුවේ. මේ නිසා ජලය වැඩි වීම නිසා වගේම අඩු වීම නිසා සතුන්ට සිදුවෙන අනතුරු ඉබේටම වැළකෙනවා.

නවාතැන ඉදිරියේ රියාස් කුරුලු කූඩුවකි. රියාස් කුරුල්ලන් බිත්තර ප්‍රවේසම් කරති. අව්වට මෙම බිත්තර පෙරළ පෙරළා හිරු රැස් වැටෙන විදිහට ආරක්ෂා කරන්නේ Rheasකුරුල්ලන්ය. පැන්ටනාල් ප්‍රදේශය මධ්‍යයේ වූ ගොවි බිම් වලOstrichවර්ගයේ සමානකම් ඇති කුරුල්ලන්ය. මෙම ගොවි බිම ක්‍රි.ව.1880 දි ආරම්භ කළ අතර එවිට එහි විශාලත්වය 2,40,000 ක් විය. අවුරුදු 50 කට පෙරාතුව හෙක්ටයාර් 14,000 ක් තුළ නිර්මානය කළ ගොවි බිම අද හෙක්ටයාර් 5000 කට සීමා වී තිබෙනවා. දැනට මෙම ගොවි බිමේ අයිතිකරු 'නේටා' ගේ නිවසේ සිටින්නේ මැංකෝ ගිරා යුවලකි. ඔවුන් දිගින් මීටරයක් පමණය. නිල් පාට මෙම මැංකෝ ගිරවුන්ගේ හොට මුල සහ ඇස් වටා කහපාට ලප දෙකකි. රහසේ සිදු වෙන ගිරා ජාවාරම නිසා අද ;මම ගිරවුන් වඳ වීමේ තර්ජනයට පත්ව සිටින අතර ඔවුන්ගේ මිළ රුපියල් ලක්ෂයකටත් එපිටය. පැන්ටනාල් ප්‍රදේශය සඳහා චාරිකාවකට සම්බන්ධ වීමට අවශ්‍ය කෙනෙකුට W.W.W.embratur.gov.br ඔස්සේ ඒ පිළිබඳව තොරතුරු ලබා ගන්න පුළුවන්.

**විලියම් ඉකෙන්බර්ගර්**
**රීඩර්ස් ඩයිජස්ට් ඇසුරිනි**
**පරිවර්තනය**
**පුන්‍යා චාන්දනි ද සිල්වා**

**පරිසරය පුරාම ඇත්තේ දුඹුරුව කහ ගැහි ගිය පරිසරයකි. ඉඳහිට හමුවුන 'පාම්' සහ 'අම්බුවා' ගසක පමණක් කොළ පැහැය තැවරී තිබුනි. එකවිටම ඔවුන් තිගැස්සී ගියේ ජල තලාවල වැසිරී සිටින කිඹුලන් සිය ගණනක් දුටු විටය.. මීටර් දෙකක් පමණ දිග ඇති සර්පයන් ගොන්නකි. ජලයෙන් ඉහළට පෙනුනේඔවුන්ගේ නෙරා ගිය ඇස් පමණි.තවත් කිලෝමීටර් කිපයක් ගෙවී ගිය විට හදිසියේම වාහනයේ තිරිංග තද විය. යූරි මීටර් 20 ක් පමණ ආපස්සට රථය ගෙන පෙන්වන ලද ගසේ කඳ සීරී තිබුණි. දැන් ටිකකට කළින් ජගුවරයෙක් මේ ගස් කඳේ නියපොතු උල් කරලා මම දෙනෙ හොඳින් පළල් කොට ගස දෙස බැලුවෙමි.**



